# උත්ථාන සමයේ සිව්වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය ක්‍රියා 2:14, 36–41

*අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් උපුටා ගත් කොටසකි.*

දෙවියන් වහන්සේ විසින් ජේසුස් වහන්සේ ස්වාමීන් හා
ක්‍රිස්තුස් බවට පත්කර වදාළ සේක.

එවිට එකොළොස් දෙනා සමග නැගී සිටි පේදුරු තුමා ශබ්ද නගා ඔවුන්ට මෙසේ කී ය. "ජුදෙව් ජනයෙනි, ජෙරුසලමේ වසන සියල්ලෙනි, මෙය දැනගන්න: මාගේ වචනවලට සාවධාන ව සවන් දෙන්න.

ඔබ කුරුසියෙහි ඇණගැසූ මේ ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේ විසින් ස්වාමීන් බවටත්, ක්‍රිස්තුන් බවටත්, පත්කර වදාළ බව මුළු ඉශ්රායෙල් ජනතාව සහතික ලෙස දැනගනිත් වා."

ඔව්හු ඒ අසා සන්තාපිත සිත් ඇති ව "සහෝදරවරුනි, අප කුමක් කළ යුතුදැ"යි පේදුරුගෙන් ද අනෙක් ප්‍රේරිතයන්ගෙන් ද විචාළහ. පේදුරුතුමා පිළිතුරු දෙමින්, "ඔබ සියලු දෙනා ම පසු තැවී සිත්හරවාගෙන පව්කමාව ලබන පිණිස ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් බව්තීස්ම–ස්නාපනය ලබන්න. එවිට ඔබ ශුද්ධාත්ම දීමනාව ලබන්නාහු ය.

මන්ද, ඒ පොරොන්දුව ඔබටත්, ඔබගේ දරුවන්ටත්, දුර බැහැර වෙසෙන අන් අයටත්, සැබැවින් ම, අපගේ ස්වාමින් වන දෙවියන් වහන්සේ විසින් කැඳවනු ලබන සියල්ලන්ටත් ය"යි කී ය. ඔහු තවත් බොහෝ වචනවලින් උදක් ම අයදිමින්, "මේ කුහක පරම්පරාවෙන් ගැළැවෙන්නැ"යි ඔවුන්ට අනුශාසනා කළේ ය. එවිට ඔහුගේ වචනය පිළිගත් අය බව්තීස්ම–ස්නාපනය කරනු ලැබූ හ. ඒ දවසේ දී තුන්දාහක් පමණ පුද්ගලයෝ ඔවුන්ගේ සංඛ්‍යාවට එකතුකරන ලදහ.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 23: 1–6

**පිළිතුර:** සමිඳාණෝ මා එඬේරාණෝ ය. අග හිඟ මට නොවන්නේය.

**ගීය :** සමිඳාණෝ මාගේ එඬේරාණෝ ය: අග හිඟ මට නොවන්නේ ය.
එතුමාණෝ තිල් තණබිම් මත මා සතප්වා,
නිසල දිය වෙත මා පමුණුවා, මා පණගන්වන සේක.
සිය නාමයේ මහිමය සැලසෙන ලෙස දම්වූ මඟ මා ගෙන යන සේක.

මරණය වැනි ගත'දුරු රුදුරු නිම්නය මැදින් ගියත්,
ඔබ මා සමඟ බැවින්, මට කිසි බියක් නොවන්නේ ය.
ඔබේ කෙවිට ද සැරයැටිය ද මා නියත සැනසිල්ල වන්නේ ය.

ඔබ මාගේ සතුරන් ඉදිරියේ දී, මංගල බොජුනක් පිළියෙළ කර දී,
මා සිරස තෙලින් ආලේප කරන සේක.
මාගේ කුසලාන උතුරා යන්නේ ය.
ඔබේ දයාව හා කරුණාව නියත ව,
දිවි හිමියෙන් මා අනුව එන්නේ ය.
සමිඳුන්ගේ නිවාසය මාගේ සදාතන වාසය වන්නේ ය.

## දෙවන දේව ප්‍රකාශනය 1පේදුරු 2:20–25

*ශුද්ධ වූ පේදුරු තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

ඔබ මංමුළාව සිටියහුය. නමුත් දැන්
ඔබේ එඬේරා වෙතට හැරී සිටින්නහුය.

ඔබ වරද කොට, ඊට සුදුසු දඬුවම ලබන කල්හි ඉවසන්නහු නම් එහි කුමන වටිනාකමක් තිබේ ද? එහෙත් ඔබ යහපත කොට, ඒ ගැන දුක් විඳිමින් ඉවසන්නහු නම් එය දෙවියන් වහන්සේ ඉදිරියෙහි ප්‍රශංසනීය දෙයකි. ඔබ කැඳවනු ලැබුයේ මේ සඳහා ය. මන්ද ක්‍රිස්තුස් වහන්සේ ඔබ උදෙසා වද විඳ, ඔබ උන් වහන්සේගේ අඩිපාරේ යන පිණිස ඔබට ආදර්ශයක් දුන් සේක. උන් වහන්සේ කිසි පවක් නොකළ සේක. කවදාවත් බොරුවක් ද නොවදාළ සේක. උන් වහන්සේට නින්දා කරනු ලැබූ කළ, නින්දා නොකළ සේක.

වද වින්ද කල තර්ජනය නොකර, දැහැමි ලෙස විනිශ්චය කරන තැනැත්වහන්සේට තමන් ම භාර දුන් සේක. පාපවලට අප නැසී, දැහැමි ජීවිතයක් ගත කරන පිණිස උන් වහන්සේ ම තමන්ගේ ශරීරයෙන් කුරුසිය මත අපගේ පාප ඉසුලූ සේක. ඔබ සුව කරනු ලැබුවේ උන් වහන්සේගේ තුවාල නිසාය. ඔබ බැටළුවන් මෙන් මංමුළා ව යමින් සිටියහු ය. එහෙත් දැන් ඔබගේ ජීවිතවල එඬේරා ද භාර කාරයා ද වෙතට ඔබ හැරී සිටින්නාහු ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ජොහන් 10:14

ආලේලූයා! ආලේලූයා!
"යහපත් බැටළු එඬේරා මම වෙමි.
මම මගේ බැටළුවන් අඳුනමි:
ඔව්හු ද මා අඳුනති" යි
ස්වාමින් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය ජොහන් 10:1-10

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### බැටළුවන්ට දොරටුව මම වෙමි.

ජේසුස් වහන්සේ කතා කරමින්, "ඒකාන්තයෙන් ම මම ඔබට කියමි, දොරටුවෙන් බැටළු ගාලට ඇතුළු නොවී අන් තැනකින් නැගී පැන එන්නා සොරෙක් ද කොල්ලකන්නෙක් ද වේ. එහෙත් දොරටුවෙන් ඇතුලු වෙන්නා බැටළුවන්ගේ එඬේරා ය. දොරටු පාලයා ඔහුට දොර හරියි: බැටළුවෝ ඔහුගේ කටහඬ අඳුනති. ඔහු තමාගේ ම බැටළුවන්ට නම් කියා අඬගසා උන් පිටතට ආ විට, උන්ට පෙරටුව යයි: බැටළුවෝ ද ඔහුගේ කටහඬ අඳුනන බැවින් ඔහු පසුපස්සේ යති. එහෙත් බැටළුවෝ අමුත්තෙකු පසු පස්සේ නොයති: එපමණක් නොව, ඔහු වෙතින් පලා යති. මන්ද, උන් අමුත්තන්ගේ කටහඬ නාඳුනන බැවිනි"යි වදාළ සේක.

ජේසුස් වහන්සේ මේ උපමාව ඔවුන්ට වදාළ නමුත්, එයින් කුමක් අදහස් කළ සේක් දැ යි ඔව්හු තේරුම් නොගත්හ.

එහෙයින්, යළිත් ජේසුස් වහන්සේ ඔවුන් අමතා, "ඒකාන්තයෙන් ම මම ඔබට කියමි. බැටළුවන්ට දොරටුව මම ය. මට පළමුව ආ සියල්ලෝම සොරු ද කොල්ලකන්නෝ ද වෙති. බැටළුවෝ ඔවුන්ට ඇහුම්කන් නුදුන්හ. දොරටුව මම ය: මා තුළින් යමෙක් ඇතුලු වන්නේ ද ඔහු ගළවනු ලැබ ඇතුළට හා පිටතට ගොස් ආහාර ලබන්නේ ය. සොරා එන්නේ සොරකම් කරන්නටත්, මරන්නටත්, විනාශ කරන්නටත් පමණකි. මා පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබෙන පිණිස ය. සපුරා ම එය ලැබෙන පිණිස ය"යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*